www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධයෙහි දේශපාලන ඇඟවීම්

## Political implications of the Sri Lankan war

2009 මැයි 18

රටේ දිග් ගැස්සුනු සිවිල් යුද්ධය එහි ලේ වැකි අවසානයට පැමින තිබේ. සති ගනනාවක් තිස්සේ හමුදාවේ අඛන්ඩ ප්‍රහාරයට ලක්ව තිබූ එල්ටීටීඊයේ අවසන් කුඩා භූමිභාගයෙන් සති අන්තයේදී දස දහස් ගනනක් දෙමල සිවිල් වැසියන් වැල නොකඩවා පිටතට ඇදී ආහ. ඉතිරිව සිටින එල්ටීටීඊ සටන්කරුවන් පරාජය භාරගෙන ඇති බව වාර්තා විය.

හමුදාවේ අපරාධ පිලිබඳ සම්පූර්න තොරතුරු මාධ්‍ය වාරනය පසු පස සැඟව තිබේ. එක්සත් ජාතීන්ගේ ගනන් හිලව්වලට අනුව, ජනවාරි 20 හා මැයි 07 වන දින අතරතුර මිය ගිය සිවිල් වැසියන් සංඛ්‍යාව, මේ වසර තුල ඉරාකය, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය හා ගාසාවේ විපතට පත්වූවන්ගේ මුලු සංඛ්‍යාව ඉක්මවා ගොස් 7000 තරම් ඉහල නැඟ තිබේ. ඉන් පසු දින 10 ඇතුලත තවත් බොහෝ සංඛ්‍යාවක් මියගොස් ඇත. ජෝන් එල්ඩර් නමැති යුනිසෙෆ් ප්‍රකාශකයා යුද කලාපයේ තත්වය විස්තර කලේ සිය ගනන් ලමුන් මියගොස් ඇති "ඇදහිය නොහැකි අපායක්" ලෙස ය. "පසුගිය සති කිහිපය තුල මෙම ග්‍රහ ලෝකය මත එම කුඩා වෙරල තීරයට වඩා නරක තවත් තැනක් තිබිය නොහැකිය." ඔහු කියා සිටියේය.

ආන්ඩුව හා ජනමාධ්‍ය, හමුදාවේ ජයග්‍රහන මුල්කරගෙන කොලඹ දී ජයගොස නැංවීමේ වාතාවරනයක් නිර්මානය කර ගැනීමේ උත්සාහයක නිරතව සිටියහ. සෙනසුරාදා ජෝර්දානයේදී කථාවක් පැවැත්වූ ජනාධිපති මහින්ද රාජපක්ෂ කියා සිටියේ ඔහු ආපසු යන්නේ "ත්‍රස්තවාදයෙන් තොර" රටකට බවය. ආන්ඩුවේ ආධාරකරුවන් කොඩි වනමින් රූපවාහිනී කැමරා ඉදිරියේ පෙනී සිටි අතර නිසොල්මන්වීමේ පොදු මනෝභාවයක් පැතිර පැවතියේය. යුද්ධයේ තොරතුරු මත මාධ්‍ය තහනමක් පැනවී තිබිය ද, මිලිටරියේ රැඳවුම් කඳවුරු තුලට ගාල්කර තිබෙන දෙලක්ෂයකට අධික දෙමල සිවිල් වැසියන්ගේ ඉරනම පිලිබඳව හෝ තමන්ගේ නම විකුනාගෙන කරගෙන යන අපරාධ පිලිබඳව සාමාන්‍ය ජනතාව අන්ධව සිටියේ නැත.

සිංහල දෙමල හා මුස්ලිම් යන සියලු වැඩ කරන ජනතාව මුහුනපා සිටින හදිසි දේශපාලන අභියෝගය වන්නේ ආන්ඩුවේ මිලිටරි ජයග්‍රහනයේ දේශපාලන ඇඟවුම් කෙරෙහි අවධානය යොමු කිරීමයි. ආරම්භයේ පටන් ම සිවිල් යුද්ධය යොදාගනු ලැබ තිබුනේ කම්කරුවන් වාර්ගික රේඛාවන් ඔස්සේ බෙදා වෙන්කිරීමේ මාධ්‍යයක් ලෙසත්, ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ හා එහි දේශීය හවුල්කරුවන්ගේ ආසක්තයන් වෙනුවෙන් ඔවුන්ගේ ජීවන තත්වයන් මත එල්ල කල ප්‍රහාර යුක්ති සහගත කිරීමටත් ය. සමාජවාදී සමානතා පක්ෂය (සසප) හා එහි පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය, යුද්ධය ගෙනයන්නේ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන්ය යන කියාපෑම එක එල්ලේ ප්‍රතික්ෂේප කරනු ලැබුනි. එය වැඩ කරන ජනතාව සඳහා යුද්ධයක් නොව ඔවුන්ට එරෙහි යුද්ධයකි.

මෙම තීන්දුව මුලුමනින්ම සනාථ වී තිබේ. වාර්ගික ගැටුම පැවති 26 වසර පුරාවට ම කම්කරු පන්තිය බෙදවාචකයන් හැරෙන්නට අන් කිසිවක් හිමි කරගෙන නැත. ඒ වෙනුවට බලයට පත් සෑම ආන්ඩුවක් ම, දශක ගනනාවක් තිස්සේ ඉමහත් දුෂ්කරතාවන් මධ්‍යයේ දිනාගෙන තිබූ සමාජ හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උදුරා ගැනීමටත්, ඒවා වනසා දැමීමටත් සිවිල් යුද්ධය උපයෝගී කරගෙන තිබේ.

දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය විසින් පතුරුවා හරින බඩ දැඟලවන සුලු යුද උන්මාදය සියලු කම්කරුවන් විසින් ප්‍රතික්ෂේප කල යුතු ය. මෙය ඔවුන්ගේ යුද්ධයක් නොවන බවත් ඔවුන්ගේ ජයග්‍රහනයක් නොවන බවත් සසප කම්කරුවන්ට කියා සිටියි. ජයග්‍රහනයේ පාජාව පිටුපසින් කම්කරු පන්තියේ සමාජ හා ආර්ථික තත්වයනට එරෙහිව නව ප්‍රහාරයක් සූදානම් වෙමින් පවතින බවට අපි අනතුරු අඟවන්නෙමු.

පසුගිය තෙවසර පුරා ආන්ඩුව, මිලිටරි වියදම් දෙගුන කරමින් හා රට ජාත්‍යන්තර බැංකුවලට උගස් තබමින් සිය ජයග්‍රහනය ලබාගැනීම සඳහා කිව නොහැකි තරම් සම්පත් කොල්ලකා ඇත. ආන්ඩුව සිය විදේශ සංචිත වියැකී යාමට ද, නය පැහැර හැරීම හා බංකොලොත්භාවයේ අද්දරට ද පැමින සිටියි.

ප්‍රජාතන්ත්‍රවාදයේ හා සමෘද්ධියේ නව යුගයක් ප්‍රකාශකරන අතරතුර රාජපක්ෂ, දැනටමත් ආර්ථික යුද්ධයක් අරඹා ඇත. "ජාතිය ගොඩනැගීමේ" කඩතුරාව යටතේ ආන්ඩුව, 1930 ගනන් වලින් පසුව එලඹි නරකම ගෝලීය ආර්ථික පසුබෑම මගින් දැන් උග්‍ර අතට පත්කර තිබෙන, පසු ගිය තෙවසරේ ආර්ථික බර සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ කර මත පාත්කරනු ඇත. නව සතුරා වනු ඇත්තේ ආන්ඩුවේ පිලිවෙත්වලට විරුද්ධවන හෝ විවේචනය කරන හා සිය ජීවන තත්වයන් ද රැකියාවන් ද රැකගැනීම සඳහා සටන් කරන කම්කරුවන්, ගොවීන් හා තරුනයන් ය. යුද්ධයට පිටුබලය දුන් එම "වමේ" පක්ෂ හා වෘත්තීය සමිති නිලධරයන්ම, දැන් වැඩ කරන ජනතාවට එරෙහි නව ආර්ථික ප්‍රහාරයන්හි දී ආන්ඩුවට පිටුබලය දෙනු ඇත.

සීමාවන් පැනවීම සඳහා තමන් අත ඇති එම වැඩ පිලිවෙල ජනතාවගේ කර මතට පැටවීම සඳහා ආන්ඩුව, එල්ටීටීඊ විරුද්ධ යුද්ධයේදී භාවිතා කල එම පොලිස් රාජ්‍ය පියවරයන් ම යොදාගැනීමට පසුබට නොවනු ඇත. පසුගිය දශක දෙක හමාර තුල මිලිටරිය ප්‍රමානයෙන් මෙන්ම දේශපාලන බලපෑම අතින් ද ඉමහත් ලෙස පුලුල් කර තිබේ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සහිත කෝම්බය තිබිය දී ම සැබවින්ම බලය රැඳී පැවතුනේ මිලිටරි නායකයන් ප්‍රමුඛ භූමිකාවක් ඉටුකර තිබෙන ජනාධිපති වටා පැවති කල්ලියක් අත ය.

ආන්ඩුවේ මිලිටරි ජයග්‍රහනයෙන් සිදුවනු ඇත්තේ පාලක පැලැන්තියේ අතිශයින්ම ප්‍රතිගාමී ස්ථරයන් ශක්තිමත් වීම පමනකි. අද ජයගෝසාවේ වැඩිම හඬ නගන්නේ ජනතා විමුක්ති පෙරමුන, ජාතික හෙල උරුමය හා ජාතික නිදහස් පෙරමුනේ සිංහල අන්තවාදීන්ය. මීලඟ අවධිය තුල වැඩ කරන ජනතාව තුලින් පලවන විරුද්ධත්වයට හා අරගලවලට එරෙහි මැරබලකායන් ලෙස ඔවුන් යොදාගැනීමට නියමිතව ඇත.

යුද්ධයට තුඩුදුන් එකදු දේශපාලන ප්‍රශ්නයකට හෝ විසඳුම් ලැබී ඇත්තේ නැත. මෙය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" නොව වැඩ කරන ජනතාවගේ වියදමෙන් සිංහල ප්‍රභූ පැලැන්තියේ බලය හා වරප්‍රසාද රැකගැනීමේ යුද්ධයකි. විසඳුම් සොයනවා වෙනුවට ආන්ඩුව, දෙමල විරෝධී වෙනස්කම් කිරීමට තෙල් වත්කර සමස්ත දේශපාලන සංස්ථාපිතය ම වාර්ගික ආතතීන්ගෙන් ගිනි ඇවිලවීම තුලින් ඒවා තවදුරටත් ඔඩු දුවමින් නව රූපයකින් පුපුරා යනු ඇත.

ව්‍යසනයේ ප්‍රධාන වගකීම එල්ටීටීඊ වෙත පැවරේ. දෙමල ජනතාවගේ නොව දෙමල ධනේශ්වරයේ ආසක්තයන් නියෝජනය කල වෙනම ධනපති රාජ්‍යයක් පිලිබඳ එහි මූලෝපාය, එක් හෝ තවත් මහා බලවතෙකුගේ සහාය පැතීමේ රාජ්‍යතාන්ත්‍රික උපාමාරු හා ත්‍රස්තවාදයේ සංකලනයක් විය. එල්ටීටීඊ සාමාන්‍ය සිංහල ජනතාවට එල්ල කල ත්‍රස්ත ප්‍රහාර කෙලින්ම කොලඹ තන්ත්‍රයේ දෑත් සවිමත් කල අතර ඒ සමග ම සිය දේශපාලන විරුද්ධවාදීන් රුදුරු ලෙස මැඩීමේ එහි ක්‍රියා පිලිවෙත දෙමල ප්‍රජාවේ විශාල කොටසකින් එය හුදෙකලා කරදැමීය. එය අගමැති රජීව් ගාන්ධි මරා දැමීමෙන් සිදුවූයේ ශ්‍රී ලංකාවේ දෙමල ජනතාවගේ ඉරනම පිලිබඳ වගකීමෙන් අත සෝදා ගැනීමට ඉන්දීය ආන්ඩුවට ඉඩ සැලසීම පමනකි.

ශ්‍රී ලංකාවේ ද උප මහාද්වීපය පුරා ද වැඩ කරන ජනතාව යුද්ධයේ ප්‍රතිපල වලින් අවශ්‍ය දේශපාලන පාඩම් උකහාගත යුතුය. ජාතිවාදයේ සියලු රූපාකාරයන් මෙන්ම දෙමල බෙදුම්වාදය ද මහා ජනතාවන් සම්බන්ධයෙන් ගත් කල ප්‍රතිගාමී වූ මර උගුලක් බව සනාථ කෙරී තිබේ. මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ හැකියාව හා මානව වර්ගයා ප්‍රගමනය කරා ගෙනයා හැකි හා එකම සමාජ බලවේගය වන කම්කරු පන්තිය, වාර්ගිකත්වය, භාෂාව හෝ ජාතිකත්වය නොතකා සිය අරගල සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ඒකාබද්ධ කල යුතුය.

ශ්‍රී ලංකාව තුල සිදුකල අපරාධ වනාහි, ගෝලීය ධනේශ්වර පද්ධතියේ ප්‍රගාඪ ජරපත්වීමේ එක් නිමිත්තක් වනවා පමනි. කලාපය පුරා ද ජාත්‍යන්තරව ද අධිරාජ්‍යවාදී කුමන්ත්‍රන, එදිරිවාදිකම් හා යුද්ධයේ නව අවධියක් විවෘත වෙමින් තිබේ. ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපදය මෙහෙයවන නව විජිතකරන යුද්ධය පකිස්ථානය දක්වා ම පතුරුවා හැර අති අතර, මෑත දිනවල දී ගැටුම්වලින් පලායන කම්පාවට පත් ලක්ෂ ගනන් සරනාගතයන්ගේ ගංගාවක් නිර්මානය කර තිබේ.

මෙම ම්ලේච්ඡත්වයට එරෙහිව කම්කරු පන්තිය විසින් කරන ඕනෑම අරගලයක මුල් ගල විය යුත්තේ ජාත්‍යන්තර ඉදිරිදර්ශනයකින් සන්නද්ධ වීමයි. එහිදී සියලු වර්ගයේ ජාතිවාදයන් හා වර්ගවාදයන් පිටුදැකීම මඟ නොහැරිය හැකිය. ශ්‍රී ලංකාවේත් කලාපය තුලත් කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් සමාජවාදී සමානතා පක්ෂය ඉල්ලා සිටින්නේ, යුද්ධයෙන් අවශ්‍ය දේශපාලන නිගමන කරා එලඹෙන ලෙසත්, අපගේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය හදාරන ලෙසත්, එලඹෙන අරගලයන්හි විප්ලවවාදී නායකත්වය ලෙස සමාජවාදී සමානතා පක්ෂයත් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවත් ගොඩනැගීමේ අරගලයට ඒකාබද්ධවන ලෙසත් ය.

**විජේ ඩයස්**

© www.wsws.org